# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
# முகாமைத்துவ சேவைகள் திணைக்களம்
# Department of Management Services

## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## Annual Performance Report
## 2014


**මහා භාණ්ඩාගාරය, කොළඹ - 01**

**பொதுத் திறைசேரி, கொழும்பு - 01**

**General Treasury, Colombo - 01**

දුරකථන
தொலை பேசி: **011 – 2484757**
Telephone

ෆැක්ස්
தொலை நகல்: **011 - 2430270**
Fax

ඊ-මේල්
மின் அஞ்சல்: **dgms@msd.treasury.gov.lk**
E-mail

# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## වාර්ෂික කාර්යසාධන වාර්තාව

## 2014

මහා භාණ්ඩාගාරය

කොළඹ - 01


දුරකථන : 011 -2484757

ෆැක්ස් : 011-2430270

ඊ-මේල් : dgms@msd.treasury.gov.lk

# දැක්ම

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම

# මෙහෙවර

රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රශස්ථ තනතුරු ප්‍රමාණ රාජ්‍ය ආයතන වෙත ලබාදීම

**අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ..........................**

රාජ්‍ය අංශයේ විවිධ ක්ෂේත්‍ර තුළ කාලීනව පැන නගින මානව සම්පත් අවශ්‍යතාවයන් ද රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන්ද සැලකිල්ලට ගෙන රාජ්‍ය අංශය තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමේ අභියෝගාත්මක කාර්යයට 2014 වර්ෂයේදී සාර්ථකව මුහුණ දීමට හැකිවිය.

නව ජවයකින් ඉදිරියට යන සංවර්ධන ප්‍රවේශය තුළ රජය විසින් සැලසුම් කර ඇති සීඝ්‍ර ආර්ථික හා සමාජ අභිවෘද්ධි ඉලක්ක ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම ලෙස සලසා දෙමින් සංවර්ධන ක්‍රියාවලිය පහසු කිරීමටත් මහජනතාව තෘප්තිමත් වන අයුරින් නිවැරදි, කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් ලබා දීමටත් හැකි වන පරිදි රාජ්‍ය අංශයේ මානව සම්පත වඩාත් යෝග්‍ය හා ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරයයි. ඒ අනුව 2014 වර්ෂය, යථෝක්ත කාර්යභාරය සඵලමත් කර ගැනීම අරභයා සාධනීය දායකත්වයක් ලබාදීමට හැකි වූ වසරක් බව ප්‍රකාශ කරනුයේ හදපිරි සතුටිනි.

අප දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම උදෙසා සාකල්‍යයෙන්ම නිසි මග පෙන්වීම හා සහයෝගය ලබා දුන් භාණ්ඩාගාරයේ ලේකම්තුමාට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ සහෝදර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ හදපිරි ප්‍රණාමය පුද කරමි. අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දෙමින් සහයෝගය දැක්වූ ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ද වැදගත් කාර්යයක් ඉටු කරමින් සහයෝගය පල කළ මුදල් කොමිෂන් සභාව සහ සියළුම රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ට ද මාගේ ප්‍රණාමය පුද කරමි. තව ද, සංවිධානාත්මකව, කණ්ඩායම් හැඟීමෙන් හා සහයෝගයෙන් යුක්තව දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කළ කාර්ය මණ්ඩලයට ද ප්‍රශංසාව පිරිනමමි.

**එන්. ගොඩකන්ද**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


| | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම | 1 – 2 |
| 2. කාර්ය මණ්ඩල කළමනාකරණය | 3 – 8 |
| 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය | 9 |
| 4. පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය | 10 – 12 |
| 5. ආයතන අංශය | 13 – 20 |
| 6. මූල්‍ය අංශය | 21 – 22 |


## උපලේඛන


I. සංවිධාන ව්‍යූහය 23

# 1. හැඳින්වීම

## 1.1 ආරම්භය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පළමු ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස 1999 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබීය. එතැන් සිට ජාතික, පළාත් සභා හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය හඳුනාගැනීමත්, එම හඳුනාගන්නා තනතුරුවලට අදාළ වැටුප් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමත්, බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබාදීමත් ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සපයා ඇත. මෙහිදී රටේ මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම ඉතා අත්‍යාවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ අනෙකුත් ආයතන සමඟද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 පරමාර්ථ

රාජ්‍ය අංශයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා පරමාර්ථ කිහිපයකින් මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය
ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම
iii. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම

## 1.3 කාර්යභාරය

(i) ජාතික වැටුප් කොමිෂන් සභාවට/අග්‍රස්ථ ආයතනයන්ට සේවා සැපයීම.
(ii) රාජ්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ අන්වේෂණය පවත්වා ගැනීම.
(iii) මෙහෙවර, පරමාර්ථ, ක්‍රම පද්ධති, පරිපාටි සහ කාර්ය මණ්ඩල සම්පාදනය පිළිබඳ ආයතනික සමාලෝචන පවත්වා අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
(iv) රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා නිසි ප්‍රමාණයට සැකසීම අරමුණු කොට ගෙන රාජ්‍ය අංශයේ ආයතනවල ද්විත්වකාරක (Duplicating) කාර්යයන් හඳුනා ගැනීම.
(v) රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා සඵලතාවය සහතික කිරීමේ අදහස පෙරදැරිව ආයතනික හා කාර්ය මණ්ඩල සමාලෝචන පැවැත්වීම, ක්‍රම පද්ධති වැඩි දියුණු කිරීම, සංවිධාන ව්‍යුහයන් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීම.
(vi) සේවක සංඛ්‍යා අවශ්‍යතාවයන් පිළිබඳ සම්මත මිණුම් සහ ප්‍රමිතීන් ගොඩනගා ගැනීම.

(vii) අතිරික්ත සේවක සංඛ්‍යාවන් හඳුනා ගැනීම, ඔවුන් නැවත සුදුසු පරිදි යෙදවීම සහ සේවාහරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(viii) භෞතික පරිසරය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන්, යාන්ත්‍රීකරණය/පරිගණකගතකරණය සහ සේවා බාහිරකරණය සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

(ix) සංවර්ධන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සේවා ව්‍යවස්ථා, සේවා කොන්දේසි සමාලෝචනය පිළිබඳ අධ්‍යයනයන්හි යෙදීම සහ යෝජනා ඉදිරිපත් කිරීම.

(x) රාජ්‍ය අංශය තුළ විශ්‍රාමික නිලධාරීන් යළි සේවයේ යෙදවීම, උපදේශකයින් යොදවා ගැනීම පිළිබඳ යෝජනා පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම.

(xi) රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙහි කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධති පවත්වා ගැනීම.

(xii) බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, දක්ෂතා සංවර්ධන පුහුණු සහ අනුප්‍රාප්තිය සැලසුම් කිරීම පිළිබඳ අධ්‍යනයන්හි සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ බලධාරීන්ට සහාය වීම.

(xiii) රාජ්‍ය අංශයේ වැටුප් සහ ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම, සුභ සාධක යෝජනා ක්‍රම සහ වෙනත් එවැනි පාරිශ්‍රමික සංචිතීන් කළමනාකරණය පිළිබඳ නිර්නායක ගොඩනැගීම හා රාජ්‍ය අංශය සඳහා වෘද්ධෝපගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයනයන්හි නිරත වීම හා ඒ අනුව නිර්දේශ ලබා දීම.

## 2. කාර්ය මණ්ඩල කළමනාකරණය

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් ප්‍රධාන කාර්යයන්ගෙන් සමන්විත වේ.

- නව තනතුරු අනුමත කිරීම
- පුරප්පාඩු පිරවීම අනුමත කිරීම
- තනතුරු යටපත් කිරීම
- තනතුරු නාම සංශෝධනය කිරීම
- රාජ්‍ය ව්‍යාපෘතීන් සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම.

රාජ්‍ය අංශය වෙත පැවරී ඇති කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුවේ. ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යාපෘතීන්හි කාලීනව පැන නගින මානව සම්පත් අවශ්‍යතාවයන්ද රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන් සැලකිල්ලට ගෙන ආයතන තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක්ද පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2014 වර්ෂය තුළ සිය කාර්යභාරය ඉටු කරන ලදී.

### 2.1 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය හා ආංශික සංයුතිය

රාජ්‍ය අංශයේ සමස්ථ සේවා නියුක්තිය 2014.12.31 දිනට 1,302,258 ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, බැංකු හා මූල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ ආරක්ෂක හමුදාවන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සමස්ථ කාර්ය මණ්ඩල සංයුතිය පහතින් දැක්වේ.

**වගු අංක - 01** **රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2014**

| පරිපාලන මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජාතික මට්ටම | 844,948 | 703,600 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 392,698 | 377,445 |
| **සමස්ථ රාජ්‍ය සේවය** | **1,237,646** | **1,081,045** |
| රාජ්‍ය ව්‍යාපාර හා බැංකු | 245,339 | 221,213 |
| **සමස්ථ රාජ්‍ය අංශය** | **1,482,985** | **1,302,258** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.2 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2014

මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් හා රාජ්‍ය ප්‍රතිපත්තීන් අනුව ආර්ථික සංවර්ධන කටයුතු පහසු කිරීම උදෙසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු රාජ්‍ය අංශය සඳහා 2014 වසර තුළදී ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව රාජ්‍ය සේවයේ තනතුරු ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික වශයෙන් මට්ටම් හතරකින් සමන්විත වේ. සේවා මට්ටම් අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය වගු අංක 02 යටතේ දැක්වේ.

**වගු අංක - 02 සේවා මට්ටම අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය - 2014**

| පරිපාලනමය මට්ටම | සේවා මට්ටම | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීය | ප්‍රාථමික | |
| ජාතික | 26,251 | 24,760 | 692,825 | 180,977 | **924,813** |
| පළාත් සභා | 13,781 | 15,463 | 236,789 | 61,423 | **327,456** |
| පළාත් පාලන ආයතන | 1049 | 882 | 15,798 | 32,260 | **49,989** |
| මුළු එකතුව | **41,081** | **41,105** | **945,412** | **274,660** | **1,302,258** |
| ප්‍රතිශතය (%) | **3** | **3** | **72** | **22** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ මට්ටමේ වගකීම් දරන ඉංජිනේරු, අධිකරණ, නීති, වෛද්‍ය නිලධාරීන් සහ විධායක නිලධාරීන් ජ්‍යෙෂ්ඨ මට්ටම නියෝජනය කරමින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 3ක දායකත්වයක් හිමිකර ගනී. අධීක්ෂණ කාර්යභාරය පැවරී ඇති විධායක මට්ටමට සහාය වන පරිපාලන, සැලසුම්, ගිණුම්, නියාමන, බදු සහ බලාත්මක යන කාර්යන්හි නියුතු නිලධාරීන් හා භාෂා පරිවර්තක නිලධාරීන් තෘතීය මට්ටම වශයෙන් සමස්ත රාජ්‍ය අංශයට සියයට 3ක දායකත්වයක් සපයනු ලබයි. සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, හෙද නිලධාරීන්, ගුරුවරුන්, ත්‍රිවිධ හමුදා සොල්දාදුවන්, පොලිස් කොස්තාපල් වැනි නිලධාරීන්ගෙන් සමන්විත ද්විතීය මට්ටම රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තියෙන් සියයට 72 ක ප්‍රතිශතයක් නියෝජනය කරයි. මින් පිළිබිඹු වන්නේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි සේවා දීපව්‍යාප්තව සැපයීම සඳහා ගුරුවරුන් හා හෙද නිලධාරීන් ද රටෙහි ග්‍රාමීය කේන්ද්‍රික සේවා සැපයීම හා ග්‍රාමීය සංවර්ධන කටයුතු වෙනුවෙන් ව්‍යාප්ති නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් ද බහුල වශයෙන් සේවා නියුක්ත කර ඇති ආකාරයයි. සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවෙන් සියයට 22 ක් නියෝජනය කරන රියදුරු, කාර්යාල සහායක වැනි සේවක කාණ්ඩයන් ප්‍රාථමික මට්ටමේ සහාය සේවා සපයනු ලබයි.

### 2.2.1 නව තනතුරු ඇතිකිරීම - 2014

තනතුරු අලුතින් ඇතිකිරීමේ දී අදාළ ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රටේ මූල්‍ය ශක්‍යතාවය හා අයවැය ප්‍රතිපාදන මෙන්ම තනතුරු අලුතින් ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවයද සැලකිල්ලට යොමු කරන ලදී. රාජ්‍ය අංශය සඳහා තනතුරු අලුතින් ඇති කිරීම පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා ව්‍යවස්ථාපිත ආයතන මට්ටමින් කරන ලද වර්ගීකරණය පහත වගු අංක 03 මඟින් දක්වා ඇත.

**වගු අංක - 03** **නව තනතුරු ඇති කිරීම (2011 – 2014)**

| ආයතනය | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | 2,893 | 73.3 | 38,368 | 78.1 | 15,315 | 77.0 | 5,326 | 50 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 523 | 13.2 | 8,572 | 17.4 | 3,093 | 16.0 | 3,926 | 37 |
| ව්‍යවස්ථාපිත ආයතන | 534 | 13.5 | 2,217 | 4.5 | 1,330 | 7.0 | 1,422 | 13 |
| **එකතුව** | **3,950** | **100** | **49,157** | **100** | **19,738** | **100** | **10,674** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මේ අනුව 2014 වර්ෂය සඳහා ඇති කරන ලද නව තනතුරු අතරින් සියයට 50 ක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා අනුමත කරන ලදී.

### 2.2.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2014

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් PL, RS, MN, MT, GE හා SL වැටුප් ක්‍රමයන්ට අදාළ රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන ආයතන ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ උසස් වීම/ විශ්‍රාම යාම/ ඉල්ලා අස්වීම / මිය යෑම හේතුවෙන් ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් සතු බලතල අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීමට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 මඟින් අනුමැතිය ලබා දෙන ලදී. එසේ වුවද මෙම චක්‍රලේඛ උපදෙස් මඟින් ආවරණය නොවන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා තවදුරටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය විය. එම සේවා අවශ්‍යතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින්, 2014 වසර තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන වෙතින් ලද ඉල්ලීම් අනුව තනතුරු පුරප්පාඩු 7,663 ක් සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත.

වගු අංක - 04 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2014

| ආයතනය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අමාත්‍යාංශ | 5,349 | 70 |
| දෙපාර්තමේන්තු | 710 | 9 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | - | - |
| ව්‍යවස්ථාපිත ආයතන | 1,604 | 21 |
| **එකතුව** | **7,663** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.2.3 තනතුරු යටපත් කිරීම හා තනතුරු නාම සංශෝධනය

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, නව තනතුරු ඇති කිරීම සහ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබා දීමට පමණක් සීමා නොවේ. රාජ්‍ය ආයතනවල පවතින ඵලදායී හා කාලීන නොවන තනතුරු හඳුනා ගැනීම, අදාළ ආයතනවල එකඟතාවය ද සහිතව එම තනතුරු යටපත් කිරීම, කාලීන අවශ්‍යතාවයන් අනුව තනතුරු නාම සංශෝධනය කිරීම, රාජකාරි ස්වභාවයන් අනුව පවතින තනතුරු ඒකාබද්ධ කිරීම වැනි කටයුතුද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව අදාල කටයුතු ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය හා පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලයේ දායකත්වය ඵලදායී ලෙස යොදා ගැනේ. 2011 - 2014 අතර කාලය තුළ රාජ්‍ය අංශයේ යටපත් කරනු ලැබූ තනතුරු පිළිබඳ තොරතුරු වගු අංක 05 මඟින් දක්වා ඇත.

වගු අංක - 05 තනතුරු යටපත් කිරීම (2011 – 2014)

| ආයතනය / වර්ෂය | යටපත් කරන ලද තනතුරු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** |
| අමාත්‍යාංශ | 32 | 95 | 179 | 421 |
| දෙපාර්තමේන්තු | 512 | 1853 | 494 | 15 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 62 | 66 | 1 | 30 |
| ව්‍යවස්ථාපිත ආයතන | 66 | 8 | 33 | 0 |
| **එකතුව** | **672** | **2022** | **707** | **466** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.2.4 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් කළමනාකරණය

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැළසුම් ගත කාල වකවානු තුළ නිම කිරීමට අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබාදීම හා එම තනතුරුවලට අදාළ වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි විධිවිධාන අනුව සිදු කෙරේ. 2014 වසර තුළදී ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දුනි.

වගු අංක - 06 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම - 2014

| අනු අංකය | ව්‍යාපෘතිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය | 12 |
| 02 | ජල සම්පත් සංවර්ධන ආයෝජන ව්‍යාපෘතිය ( ආසියානු සංවර්ධන බැංකු අරමුදල ) | 67 |
| 03 | මොරාන ජලාශ ව්‍යාපෘතිය | 95 |
| 04 | දේශගුණ ප්‍රත්‍යස්ථීය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 847 |
| 05 | කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය | 26 |
| 06 | මොරගහකන්ද - කළු ගඟ ව්‍යාපෘතිය | 251 |
| 07 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 29 |
| 08 | ශ්‍රී ලංකාව තුල තිරසර ( සුනිත්‍ය) ජෛව ස්කන්ධ බල ශක්ති නිෂ්පාදන සහ නව ජෛව ශක්ති තාක්ෂණය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 10 |
| 09 | ශ්‍රී ලංකාවේ ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුලුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 06 |
| 10 | ශ්‍රී ලංකා ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන | 03 |
| 11 | ශ්‍රී ලංකා මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය | 15 |
| 12 | ශ්‍රී ලංකා භෞමික භූගෝලීය රූපවාහිනී විකාශන ඩිජිටල්කරණ ව්‍යාපෘතිය | 27 |
| 13 | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 152 |
| 14 | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය | 09 |
| 15 | අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතිය | 2004 |
| 16 | ශ්‍රී ලංකා පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් සහභාගීත්ව වෙරළ කලාප ප්‍රතිසංස්කරණය හා තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | 10 |
| 17 | පොලිස් මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - මිරිහාන | 13 |
| 18 | පොලිස් තොරතුරු සහ සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය | 13 |
| 19 | කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 83 |
| 20 | විශේෂ ව්‍යාපෘතිය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 104 |
| 21 | ධීවර වරාය සහ නැංගුරම්පල සංවර්ධන ව්‍යාපෘතිය | 17 |
| 22 | ග්‍රාමීය පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 05 |
| 23 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 14 |
| 24 | ගැටුම් වලින් විපතට පත් ප්‍රදේශ වල ප්‍රජා සංවර්ධනය සඳහා ඉදිරිපෙල නිලධාරීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය | 21 |
| 25 | පුර නැගුම ව්‍යාපෘතිය | 35 |
| 26 | ශ්‍රී ලංකාවේ යුධ ගැටුම් ප්‍රත්‍යස්ථීය ශක්තිමත් කිරීම හා දේශගුණික අවධානම් කළමනාකරණය සංවර්ධන ව්‍යාපෘතිය | 13 |
| 27 | ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය | 51 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 2.2.5 පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පිහිටු වූ පළාත් සභා විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් ගුණාත්මක, ඵලදායි හා කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේදී කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් තීරණය කරන ලදී. එසේ වුවද, නව ආයතන පිහිටුවීම හා සේවා සැපයීම පුළුල්වීම හේතුවෙන් තවදුරටත් 2014 වසරේදී ද නව තනතුරු අනුමත කරන ලදී.

## 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික කළමනාකරණයද ඉතා වැදගත් ස්ථානයක් උසුලනු ලැබේ. මෙම කාර්යයේදී ජාතික වැටුප් කොමිෂන් සභාව හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා නිර්දේශද සැලකිල්ලට ගෙන අදාල තීරණ ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නගින අවස්ථාවලදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් කරනු ලබන විමසීම්වලදී අවශ්‍ය උපදෙස් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2014 වසරේදී ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අදාළ සංශෝධනයන්ට අනුරූපී වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මෙන්ම වැටුප් හා දීමනා තීරණය කිරීම ද සිදු කර ඇත. ඊට අදාලව 2014 වසර තුළදී දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ පහත සඳහන් පරිදි වේ.

**වගු අංක - 07 කළමනාකරණ සේවා චක්‍රලේඛ - 2014**

| චක්‍රලේඛ අංකය හා දිනය | විෂයය |
|---|---|
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2014 – 2014.01.06 | 2014 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීම |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 – 2014.02.11 | 2014 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම. |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 – 2014.03.31 | රාජ්‍ය සේවය සහ පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය සඳහා තනතුරු අනුමත කිරීම හා තනතුරු පුරප්පාඩු පිරවීම |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/ 2014 – 2014.09.25 | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා දිරිදීමනා ගෙවීම |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2014 – 2014.11.21 | රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2014 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 4. පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය

## 4.1 පර්යේෂණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාල වූ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප්, දීමනා හා අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබා දීම, රටෙහි සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනයේදී අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවලදී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

මෙම කටයුතු අප්‍රමාදව හා නිවැරදිව සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් කාර්යක්ෂම පර්යේෂණ අංශයක් පවත්වා ගෙන යනු ලැබේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඵලදායීව ඉටු කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම හා එම තොරතුරු විශ්ලේෂණය කර වාර්තා සැපයීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශනයන්/අධ්‍යයනයන් සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත පෞද්ගලිකවම යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ.

## 4.2 තොරතුරු හා දත්ත පද්ධතිය

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ඉහළ වැදගත්කමක් උසුලයි. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය සහ උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට මෙහිදී වැඩි වගකීමක් පැවරේ. ඒ අනුව ඵලදායි හා ක්‍රමවත් පරිගණකගත දත්ත පද්ධතියක අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින්, 2012 - 2014 වර්ෂයන්හි නිර්මාණය කරන ලද, රාජ්‍ය අංශයන්හි අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාවන් ද ඇතුලත් දත්ත පද්ධතිය මේ වනවිට සාර්ථකව ක්‍රියාත්මක වේ.

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු මෙම දත්ත පද්ධතියෙන් ලබා ගැනීමේ පහසුකම් වර්තමානයේ සලසා ඇත. ඒ අනුව වැටුප්, සේවාවන් හා කාණ්ඩ ආදී සේවක සංඛ්‍යා වර්ගීකරණයන් පිළිබඳ කරන ලද නිවැරදි තොරතුරු වාර්තා මෙම පද්ධතියෙන් අවශ්‍ය අවස්ථාවලදී පහසුවෙන් ලබා ගත හැකි වීම මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන් විශාල ලෙස පහසු වී ඇති අතර, තොරතුරුවල නිවැරදිතාවය වර්ධනය වී ඇත. මෙම දත්ත පද්ධතියේ අන්තර්ගත තොරතුරු යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු ද සලසා ඇත.

## 4.3 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා ආදී මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. 2014 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා ඒවා අයත් වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු වගු අංක 08 මගින් දක්වා ඇත.

**වගු අංක - 08** **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිරීක්ෂණ වර්ගීකරණය - 2014**

| අනු අංකය | කාරණය/ ක්ෂේත්‍රය | සංදේශ ගණන |
|---|---|---|
| 01 | තනතුරුවලට පත් කිරීම/ බඳවා ගැනීම | 81 |
| 02 | සේවය දීර්ඝ කිරීම | 123 |
| 03 | නව තනතුරු ඇති කිරීම | 07 |
| 04 | පාරිශ්‍රමික | 48 |
| 05 | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි | 58 |
| 06 | විනය කටයුතු | 05 |
| 07 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම | 62 |
| 08 | අනෙකුත් | 65 |
| **එකතුව** | | **449** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2014 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ලබා දෙන ලද මුළු අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී. වසර 2004-2014 දක්වා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ තොරතුරු වගු අංක 09 මගින් දක්වා ඇත.

**වගුව අංක - 09** **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම (2004 – 2014)**

| වර්ෂය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 562 | 605 | 820 | 780 | 750 | 1272 | 598 | 1019 | 399 | 499 | 449 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.4 කමිටු නියෝජන, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය

සංවර්ධන හා ආයතන කටයුතු සම්බන්ධ පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර ලේකම් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරී කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- ආණ්ඩුකාර සමුළු
- පළාත් ප්‍රධාන අමාත්‍ය සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන සහ නියාමන (Steering) කමිටු
- ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම්
- ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන්ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ගැටළු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අයුරින්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරනු වස් ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි.

## 5. ආයතන අංශය

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රැකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, රැකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් ලෙස සකස් කර දීමටත්, කණ්ඩායමක් සේ කටයුතු කිරීමට අවශ්‍ය අනෙකුත් සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

වර්ෂ 2014 දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2014.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩල තොරතුරු වගු අංක 10 මගින් දැක්වේ.

**වගු අංක - 10** **කාර්ය මණ්ඩල තොරතුරු 2014.12.31 දිනට**

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 01 | 01 |
| 03 | අධ්‍යක්ෂ | 07 | 05 | 02 |
| 04 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 10 | 06 | 04 |
| 05 | ගණකාධිකාරී | 01 | 00 | 01 |
| 06 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 01 | 00 | 01 |
| 07 | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| 08 | භාෂා පරිවර්තක | 01 | 01 | 00 |
| 09 | පර්යේෂණ සහකාර | 07 | 05 | 02 |
| 10 | සංවර්ධන නිලධාරී | 02 | 03 | -01 |
| 11 | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | 00 |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 29 | 26 | 03 |
| 13 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 03 | 01 | 02 |
| 14 | ලේඛන සහකාර | 01 | 00 | 01 |
| 15 | රියදුරු | 07 | 07 | 00 |
| 16 | කාර්යාල කාර්ය සහායක | 07 | 07 | 00 |
| **එකතුව** | | **81** | **65** | **16** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2014.12.31 දිනට දෙපාර්තමේන්තු සේවයේ නිරත වූ කාර්ය මණ්ඩලය පහත අංක 01 ලේඛනය මගින් දක්වා ඇත.

**ලේඛනය - 01** **කාර්ය මණ්ඩලය 2014.12.31 දිනට**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 2. | ඒ.ආර්.උඩුවාවල මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 3. | ඩී.එච්.එස්.පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ |
| 4. | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර මයා | අධ්‍යක්ෂ |
| 5. | එස්.එච්.ඩී.කළුතන්ත්‍රි මිය | අධ්‍යක්ෂ |
| 6. | එම්.කේ.එස්. ජයසේන මිය | අධ්‍යක්ෂ |
| 7. | එස්.එන්. අත්තනායක මිය | අධ්‍යක්ෂ |
| 8. | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 9. | චාමිකා මධුවන්ති මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 10. | ඩබ්.එච්.ජී.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 11. | ඩබ්.ඩී.සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 12. | එම්.ඩී.අබේගුණවර්ධන මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 13. | සී.ජී.කන්නන්ගර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 14. | ඒ.ආර්.පී.දයානි රාජපක්ෂ මිය | පරිපාලන නිලධාරී |
| 15. | පී.ඩී.ඩී. සමරසේකර මිය | භාෂා පරිවර්තක |
| 16. | එම්.ඩබ්. ජයන්ත මයා | පර්යේෂණ සහකාර |
| 17. | ආර්.කේ.ඒ. ක්‍රිශාන්ත මයා | පර්යේෂණ සහකාර |
| 18. | එස්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර |
| 19. | එම්.එම්.ඒ.එන්. මල්පෝරු මිය | පර්යේෂණ සහකාර |
| 20. | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර |
| 21. | එම්.පී.එස්. සල්ගාදු මයා | තොරතුරු තාක්ෂණ සහකාර |
| 22. | ඊ.එන්.රණසිංහ මෙනෙවිය | සංවර්ධන නිලධාරී |
| 23. | එස්.එස්.ඇල්පිටියගේ මිය | සංවර්ධන නිලධාරී |
| 24. | එච්.එස්.ඒ.හේනෙපොල මෙනෙවිය | සංවර්ධන නිලධාරී |
| 25. | එම්.ඩී.ආර්. රංජනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 26. | ඒ.එම්.එම්. ශ්‍යාමලී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 27. | ජී.එන්.එච්. අබයවර්ධන මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 28. | එම්.එන්.එම්. උසාමා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 29. | ජේ.ඒ.එන්. දේදුණු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 30. | එස්.එච්.එස්. පවිත්‍රා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 31. | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 32. | කේ.එස්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 33. | එච්.එල්.මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 34. | ඒ.එම්.එස්.එස්.කේ.අරම්පත් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 35. | ආර්.ඒ.විජේසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 36. | එස්.එස්.බියන්විල මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 37. | ඒ.අයි.එල්.සිරිසේන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 38. | ආර්.ඩබ්.ඒ.එච්.රාජසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 39. | ඩබ්.එම්.චමින්ද කුසුම් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 40. | එල්.පී.විතානගේ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 41. | එම්.එච්.එන්.ගීතිකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 42. | ඒ.කේ.ඩී.පී.සෝමසිරි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 43. | කේ.ඩී.එම්.කේ.ඩී.කප්පාගොඩ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 44. | එල්.එච්.ඒ.පී.එම්.දයාරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 45. | එච්.බී.සී.එම්.දසනායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 46. | ජේ.කේ.සුදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 47. | ටී.ශිරාණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 48. | ඩබ්.සී.ඒ.මේකලා ජීවනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 49. | ඩබ්.එස්.සඳරුවන් මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 50. | එම්.ඩී.පී.එස්.ආර්.පතිරණ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 51. | හිරන්ති දීගල මෙනෙවිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර |
| 52. | ටී.කේ.ෂාම් නිශාන්ත මයා | රියදුරු |
| 53. | කේ.පී.සිරිසෝම මයා | රියදුරු |
| 54. | ජී.පී.ඩී.සී.පී.ගුණරත්න මයා | රියදුරු |
| 55. | ඩී.එම්.අජිත් සිසිර කුමාර මයා | රියදුරු |
| 56. | ඩී.උපාලි මයා | රියදුරු |
| 57. | බී.ඒ.සුනිල් ජයරත්න මයා | රියදුරු |
| 58. | බී.ඒ.රංජිත් කුමාර මයා | රියදුරු |
| 59. | ටී.ජී. ආනන්ද මයා | කාර්යාල කාර්ය සහායක |
| 60. | ඒ.එන්.සී ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක |
| 61. | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක |
| 62. | සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |
| 63. | පී.ඒ.තිලකසිරි මයා | කාර්යාල කාර්ය සහායක |
| 64. | ගමගේ නිමල් මයා | කාර්යාල කාර්ය සහායක |
| 65. | පී.ඩබ්.ඒ.නීල් අසංක මයා | කාර්යාල කාර්ය සහායක |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.1 වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ බව අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය

**වගු අංක - 11 වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ බව අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය - 2014**

| අනු අංකය | වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| 01 | 25 අඩු | 01 | 00 |
| 02 | 26 – 35 | 10 | 08 |
| 03 | 36 – 45 | 15 | 11 |
| 04 | 46 – 50 | 05 | 10 |
| 05 | 51 – 55 | 03 | 01 |
| 06 | 55 වැඩි | 01 | 00 |
| **එකතුව** | | **35** | **30** |

මූලාශ්‍රය **:** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.2 ස්ථාන මාරුවීම්

රාජ්‍ය සේවයේ සාමාන්‍ය පටිපාටීන්ට අනුකූලව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 22 ක් විය.

**ලේඛනය - 02 2014 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 1. | එම්.ජී.ලලිත් ආනන්ද මයා | අධ්‍යක්ෂ | 2014.01.03 |
| 2. | ඩබ්.පී.සෙව්වන්දි මිය | සහකාර අධ්‍යක්ෂ | 2014.10.13 |
| 3. | ඩබ්.එම්.ප්‍රියන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 4. | වයි.එන්.කළුආරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 5. | කේ.පී.පද්මකාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 6. | ඒ.එම්.ගුණරත්න මැණිකේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 7. | ඩී.පී.එස්.ජයසේකර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 8. | රතුවඩු රමණී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 9. | ජේ.ඒ.ජී.ඩී.එන්.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 10. | එච්.යූ.කේ.රත්නායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 11. | ඩබ්.ජේ.පේරුසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 12. | ආර්.ඒ.අයි.රණතුංග මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.22 |
| 13. | විනීතා විතාරණගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.22 |
| 14. | ජී.එම්.ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.03.17 |
| 15. | ඒ.පී.ඩී.සී.එන්.වාස් ගුණවර්ධන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.03.25 |
| 16. | ඩබ්.ඩී.ජේ.යූ.සමරනාථ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.09.01 |
| 17. | එම්.එම්.අලුත්ගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.09.10 |
| 18. | අජිත් සමරවීර මයා | රියදුරු | 2014.01.08 |
| 19. | ඩී.එම්.ජේ.බී.දසනායක මයා | රියදුරු | 2014.02.06 |
| 20. | එම්.කේ.යසවර්ධන මයා | රියදුරු | 2014.04.28 |
| 21. | එම්.පී.ජේ.ගුණවර්ධන මයා | රියදුරු | 2014.06.13 |
| 22. | ඩබ්.පී.ඒ.හේමසිරි මයා | කාර්යාල කාර්ය සහායක | 2014.01.08 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2014 වර්ෂය තුළ ස්ථාන මාරුවීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව 27ක් විය. මොවුන් විවිධ රාජ්‍ය ආයතනවල සේවය කර අත්දැකීම් ලද පිරිසක් විය.

**ලේඛනය – 03 2014 වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 1. | ඩී.එච්.එස්.පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ | 2014.09.01 |
| 2. | එස්.එච්.ඩී.කළුතන්ත්‍රී මිය | අධ්‍යක්ෂ | 2014.10.14 |
| 3. | සී.ජී.කන්නන්ගර මයා | සහකාර අධ්‍යක්ෂ | 2014.04.30 |
| 4. | එම්.ඩී.අබේගුණවර්ධන මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | 2014.07.25 |
| 5. | ඩබ්.එම්.චමින්ද කුසුම් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 6. | එල්.පී.විතානගේ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 7. | ඩබ්.ඩී.ජේ.යූ.සමරනාථ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 8. | ආර්.ඒ.අයි.රණතුංග මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 9. | විනීතා විතාරණගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.01 |
| 10. | එම්.එච්.එන්.ගීතිකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.06 |
| 11. | ජී.එම්.ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.08 |
| 12. | ඒ.කේ.ඩී.පී.සෝමසිරි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.10 |
| 13. | කේ.ඩී.එම්.කේ.ඩී.කප්පාගොඩ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.10 |
| 14. | එල්.එච්.ඒ.පී.එම්.දයාරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.10 |
| 15. | එච්.බී.සී.එම්.දසනායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.13 |
| 16. | ජේ.කේ.සුදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.20 |
| 17. | ටී.ශිරාණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.02.25 |
| 18. | ඩබ්.සී.ඒ.මේකලා ජීවනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.03.05 |
| 19. | ඩබ්.එස්.සඳරුවන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.03.12 |
| 20. | එම්.ඩී.පී.එස්.ආර්.පතිරණ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.09.02 |
| 21. | අජිත් සමරවීර මහතා | රියදුරු | 2014.01.01 |
| 22. | එම්.පී.ජයසිරි ගුණවර්ධන මයා | රියදුරු | 2014.04.24 |
| 23. | ඩී.එම්.අජිත් සිසිර කුමාර මයා | රියදුරු | 2014.05.19 |
| 24. | ඩී.උපාලි මයා | රියදුරු | 2014.06.19 |
| 25. | බී.ඒ.සුනිල් ජයරත්න මයා | රියදුරු | 2014.08.04 |
| 26. | ඒ.ජී.රංජිත් කුමාර මයා | රියදුරු | 2014.11.05 |
| 27. | ඩබ්.ඒ.නීල් අසංක මයා | කාර්යාල කාර්ය සහායක | 2014.04.23 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 පුහුණු වැඩසටහන්

### 5.3.1 දේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධන වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරනු ලැබේ. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන්ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂය තුළ ලබා දුන් පුහුණු වීම් වගු අංක 12 මගින් දක්වා ඇත.

**වගු අංක -12 පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම - 2014**

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 1. | ඉහල ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කාර්ය සහායක කාර්යභාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 02 |
| 2. | පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම | නිපුණතා සංවර්ධන පදනම | 01 |
| 3. | නවක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 |
| 4. | Certificate in SLIDA Computer Driving | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 5. | කාර්ය මණ්ඩලයේ ආකල්පමය වර්ධනය සඳහා වැඩමුළුව | නිපුණතා සංවර්ධන පදනම | 53 |
| 6. | ගිණුම් පොත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | නිපුණතා සංවර්ධන පදනම | 02 |
| 7. | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | නිපුණතා සංවර්ධන පදනම | 01 |
| 8. | Residential Training Programe eGovernment for Staff Grade Officers of Public Sector | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 9. | දින 12 දෙමළ භාෂා පුහුණු වැඩසටහන | ජාතික භාෂා අධ්‍යයන හා පුහුණු ආයතනය | 01 |
| 10. | නව CIGAS පුහුණු පාඨමාලාව | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 01 |
| 11. | රාජ්‍ය සේවයේ ගිණුම් ක්‍රම හා මුදල් පාලන පොත්වල කාර්ය | නිපුණතා සංවර්ධන පදනම | 01 |
| 12. | රාජ්‍ය සේවයේ ආයතන කටයුතුවලට අදාල ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති | නිපුණතා සංවර්ධන පදනම | 03 |
| 13. | විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම | නිපුණතා සංවර්ධන පදනම | 01 |
| 14. | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | නිපුණතා සංවර්ධන පදනම | 01 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3.2 විදේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවශ්‍යතා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2014 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව නිලධාරීන් 06 දෙනෙකුට විදේශීය පුහුණු අවස්ථාවන් හිමි විය.

**ලේඛනය - 04** **විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම -2014**

| අනු අංකය | නම | තනතුර | ලැබූ පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 01 | එම්.ඒ.කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | වෙනස්වන ආසියාව සඳහා නව්‍යකරණ අධ්‍යයනය | පිලිපීනය | 2014.09.09 සිට 2014.09.10 |
| 02 | පී.සී.මධුවන්ති මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු | ජපානය | 2014.08.16 සිට 2016.10.03 |
| 03 | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී.සත්කුමාර මයා | අධ්‍යක්ෂ | ආර්ථික සංවර්ධන උපායමාර්ග | කොරියාව | 2014.07.20 සිට 2014.08.02 |
| 04 | කේ.ආර්.උඩුවාවල මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ජාතික රාජ්‍ය පරිපාලනය | ජපානය | 2014.11.09 සිට 2014.11.29 |
| 05 | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී.සත්කුමාර මයා | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය 1 ශ්‍රේණිය හැකියා වර්ධන - දෙවන විදේශ සංචාරය | මැලේසියාව | 2014.11.09 සිට 2014.11.21 |
| 06 | එස්.එච්.ඩී.කළුතන්ත්‍රී මිය | අධ්‍යක්ෂ | ආසියානු කලාපීය සහයෝගීතාවය සහ සහභාගිත්වය වටමේස සාකච්ඡා/සමුළුව | පිලිපීනය | 2014.11.17 සිට 2014.11.18 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.4 වාර්ෂික තැපැල

2014 වසරේ දෙපාර්තමේන්තුවට ලැබුණු ලිපි සංඛ්‍යාව 7231 ක් විය. මෙම ලිපි විවිධ විෂයන් සම්බන්ධයෙන් ලැබී තිබුණු අතර රාජ්‍ය ආයතන සඳහා නව තනතුරු ඇති කර ගැනීම, පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලීම්, පැහැදිලි කරගැනීම් හා සාමාන්‍ය පරිපාලනය යන විෂයන් ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

**වගු අංක - 13** **ලැබුණු ලිපි සංඛ්‍යාව - 2014**

| අනු අංකය | මාසය | ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජනවාරි | 415 |
| 02 | පෙබරවාරි | 489 |
| 03 | මාර්තු | 544 |
| 04 | අප්‍රේල් | 514 |
| 05 | මැයි | 493 |
| 06 | ජූනි | 541 |
| 07 | ජූලි | 836 |
| 08 | අගෝස්තු | 700 |
| 09 | සැප්තැම්බර් | 657 |
| 10 | ඔක්තෝබර් | 630 |
| 11 | නොවැම්බර් | 661 |
| 12 | දෙසැම්බර් | 751 |
| **එකතුව** | | **7231** |

මූලාශ්‍රය **:** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 6. මූලා අංශය

2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.38,820,000/- ක් වූ අතර සත්‍ය වියදම රු.35,281,255.04 ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 90.8% ක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් පිරිමැසුම්දායක ලෙස භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රගති වාර්තාව පහත පරිදි වේ.

වගු අංක - 14 මූල්‍ය ප්‍රගති වාර්තාව


| වැය විස්තරය | | 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරුදු තබන ලද ප්‍රතිපාදන හැර) | මුළු වියදම | වියදම් ප්‍රතිශතය % | අනුමත ප්‍රතිපාදනය | මුළු වියදම | වියදම් ප්‍රතිශතය % |
| | | (රුපියල්) | (රුපියල්) | | (රුපියල්) | (රුපියල්) | |
| **පුනරාවර්තන වියදම්** | | **35,200,000.00** | **32,777,099.21** | **93.00** | **36,720,000.00** | **33,818,294.00** | **92.00** |
| **පුද්ගල පඩිනඩි** | | **24,700,000.00** | **23,608,354.85** | **95.00** | **26,925,000.00** | **25,295,516.00** | **93.94** |
| 1001 | වැටුප් හා වේතන | 17,000,000.00 | 15,259,204.69 | 89.00 | 17,000,000.00 | 15,386,291.45 | 90.50 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 700,000.00 | 818,713.66 | 1.16 | 900,000.00 | 885,202.44 | 98.30 |
| 1003 | වෙනත් දීමනා | 7,000,000.00 | 7,530,436.50 | 1.07 | 9,025,000.00 | 9,024,021.83 | 99.90 |
| **ගමන් වියදම්** | | **1,000,000.00** | **893,691.18** | **89.00** | **600,000.00** | **455,548.08** | **75.92** |
| 1101 | දේශීය | 200,000.00 | 128,445.00 | 64.00 | 150,000.00 | 108,062.50 | 72.00 |
| 1102 | විදේශීය | 800,000.00 | 765,246.18 | 95.00 | 450,000.00 | 347,485.58 | 77.20 |
| **සැපයීම්** | | **4,000,000.00** | **3,784,035.79** | **94.00** | **4,660,000.00** | **4,211,755.06** | **90.30** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 800,000.00 | 1,488,982.90 | 1.86 | 1,950,000.00 | 1,852,595.22 | 95.00 |
| 1202 | ඉන්ධන | 3,000,000.00 | 2,049,947.19 | 68.00 | 2,500,000.00 | 2,186,813.54 | 87.40 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 150,000.00 | 245,105.70 | 1.63 | 170,000.00 | 158,386.30 | 93.10 |
| 1205 | වෙනත් | 50,000.00 | 0.00 | 0.00 | 40,000.00 | 13,960.00 | 34.90 |
| **නඩත්තු වියදම්** | | **1,100,000.00** | **1,028,196.64** | **93.00** | **1,200,000.00** | **779,398.28** | **64.90** |
| 1301 | වාහන | 800,000.00 | 877,795.12 | 1.09 | 900,000.00 | 675,959.64 | 75.10 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | 150,401.52 | 50.00 | 300,000.00 | 103,438.64 | 34.40 |
| **සේවා** | | **3,500,000.00** | **2,656,612.75** | **75.00** | **2,535,000.00** | **2,307,054.49** | **91.00** |
| 1401 | ප්‍රවාහන | 1,500,000.00 | 1,060,440.00 | 70.00 | 775,000.00 | 630,044.51 | 81.30 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,500,000.00 | 1,099,998.91 | 73.00 | 1,160,000.00 | 1,148,646.90 | 99.00 |
| 1405 | වෙනත් | 500,000.00 | 496,173.84 | 99.00 | 600,000.00 | 528,363,08 | 88.00 |
| **මාරු කිරීම්** | | **900,000.00** | **806,208.00** | **89.00** | **800,000.00** | **769,022.03** | **96.10** |
| 1506 | රජයේ නිලධාරීන් සඳහා දේපළ ණය පොළී | 900,000.00 | 806,208.00 | 89.00 | 800,000.00 | 769,022.03 | 96.10 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **මූලධන වියදම්** | | **15,200,000.00** | **3,491,068.95** | **22.00** | **2,100,000.00** | **1,462,961.38** | **69.60** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **10,900,000.00** | **269,328.85** | **02.00** | **1,100,000.00** | **654,971.38** | **59.50** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 10,000,000.00 | 0.00 | 0.00 | - | - | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 400,000.00 | 18,654 | 4.00 | 200,000.00 | 24,854.50 | 12.40 |
| 2003 | වාහන | 500,000.00 | 250,674.85 | 50.00 | 900,000.00 | 630,116.88 | 70.00 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | | **3,500,000.00** | **2,728,436.10** | **77.00** | **600,000.00** | **582,125.00** | **97.00** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000.00 | 2,728,436.10 | 90.00 | 600,000.00 | 582,125.00 | 97.00 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 500,000.00 | 0.00 | - | - | - |
| **හැකියා වර්ධනය** | | **800,000.00** | **493,304.00** | **61.00** | **400,000.00** | **225,865.00** | **56.40** |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 800,000.00 | 493,304.00 | 61.00 | 400,000.00 | 225,865.00 | 56.40 |
| **මුළු එකතුව** | | **50,400,000.00** | **36,268,168.16** | **71.00** | **38,820,000.00** | **35,281,255.04** | **90.80** |

මූලාශ්‍රය : ගිණුම් අංශය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**සංවිධාන ව්‍යුහය**

**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**




○ සහායක කාර්ය මණ්ඩලය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, රාජ්‍ය කළමනාකරණ සහකාර, ලේඛන සහකාර, රියදුරු, කාර්යාල කාර්ය සහායක